උතුම් ධර්ම දානයක් ලෙස පිළිගන්වන්නේ බැතියෙනි.

"සබ්බදානං ධම්මදානං ජිනාති"
(සියලු දානයන් පරදවා ධර්ම දානය ජය ගනී.)

# තණ්හාවෙන් ජය ගැනීම

දේශකයාණෝ

ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක, ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම
සංස්ථාධිපති හා ප්‍රධාන අනුශාසක, ත්‍රිපිටකධරාචාර්ය,
මහා කම්මට්ඨානාචාර්ය, ශ්‍රී ඥාණාරාම ජිනවංශ වංශාවතංශ,
සද්ධර්මවාගීශ්වරාචාර්ය
අතිපූජණීය නා උයනේ අරියධම්මාභිධාන
මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ

**මුද්‍රණය**

දිමුතු මුද්‍රණාලය

අංක 103/A, නුවර පාර, යක්කල.
දුර: 033-2239662 / 077-8829705
033-4366777 / 076-6727070
විද්‍යුත් තැපැල: dimuthupub@yahoo.com
dimuthupub@gmail.com
දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.
වෙබ්: www.dhammadanabooks.com

# පෙරවදන

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

"තණ්හං පටිච්ච පරියේසනා, පරියේසනං පටිච්ච ලාභෝ, ලාභං පටිච්ච විනිච්ඡයෝ, විනිච්ඡයං පටිච්ච ඡන්දරාගෝ, ඡන්දරාගං පටිච්ච අජ්ඣෝසානං, අජ්ඣෝසානං පටිච්ච පරිග්ගහෝ, පරිග්ගහං පටිච්ච මච්ඡරියං, මච්ඡරියං පටිච්ච ආරක්ඛෝ. ආරක්ඛාධිකරණං දණ්ඩාදාන සත්ථාදාන කලහ විග්ගහ විවාද තුවං තුවං පේසුඤ්ඤ මුසාවාදා අනේකේ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති."

(දීඝ නිකාය)

තණ්හාව නිසා සෙවීම, සෙවීම නිසා ලැබීම, ලැබීම නිසා තීරණය, තීරණය නිසා ඇලීම, ඇලීම නිසා උපාදානය, උපාදානය නිසා අයිති කරගැනීම, අයිතිය නිසා මසුරුකම, මසුරුකම නිසා රැකගැනීම, රැකීම නිසා ආරක්ෂා පිණිස දඬුමුගුරු ගැනීම ආයුධ ගැනීම වාද-විවාද නඩු කලකෝලාහල තෝ තෝ කියා බැණගැනීම කේළම මුසාවාද ආදී අනේකාකාර අකුසල ධර්ම හටගැනෙති, යනු දේශනා පාඨයේ අදහස ය. තව ද තණ්හා මූලක ධර්ම නමින් දැක්වෙන මෙම අකුසල ධර්මයන්ගෙන් ජය ගැනීමට අනුගමනය කළ යුතු එකම මග බුද්ධ ධර්මයයි.

පුන පුනා බණ ඇසීමෙන්, ඇසූ බණ සිතට ගැනීමෙන්, ඇසූ ලෙස ලිවීමෙන්, ලිඛිතව හෝ දේශනා මගින් හෝ අන් අයටත් පිරිනැමීමෙන් සුතමය ඥාණය දියුණු වීම සිදුවනුයේ නිරායාසයෙනි. නිස්සරණාධ්‍යාශයෙන් වඩන සුතමය ඥාණය, චින්තාමය ඥාණයටත්, භාවනාමය ඥාණයටත් හේතු ප්‍රත්‍යය වන බැවින් ප්‍රඥා පාරමිතාව එමගින් සපිරේ.

**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා!**

මෙයට මෙතැති,

නා උයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ

# පුණ්‍යානුමෝදනාව

තණ්හාව ගැන විස්තර කර ඇති මෙම ධර්ම පුස්තකය දෙතුන් වරක් හොඳින් කියවා මෙහි සඳහන් ධර්ම කරුණු මතක තබා ගන්න. එවිට ඔබට බොහෝ කුසල් රැස් වෙනු ඇත. එමෙන් ම සමථ-විපස්සනා භාවනා වඩා තම චිත්ත සන්තානයේ ඇති තණ්හාව දුරු කිරීමට උත්සාහ ගැනීම ඔබගේ මෙලොව-පරලොව යහපත පිණිසත්, සංසාර දුකින් එතෙර වීම පිණිසත් හේතු වන බැවින් ගුරු උපදෙස් ලබමින් සමථ-විපස්සනා භාවනා වැඩීමට යොමු වන මෙන් පුණ්‍යානුමෝදනා කිරීමට පූර්වයෙහි කාරුණිකව ආරාධනා කරමි.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ නිර්මාතෘ අපවත් වී වදාළ රාජකීය පණ්ඩිත අතිපූජණීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට පැතූ පරිද්දෙන් මතු ලොව්තුරා බුද්ධත්වය ලැබීම පිණිසත්, අපවත් වී වදාළ අතිපූජණීය මාතර ශ්‍රී ඤාණාරාම මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට ප්‍රාර්ථණීය බෝධියකට අනුව නිවන් අවබෝධ කරගැනීම පිණිසත්, මෙම දහම් පොතෙහි සඳහන් තණ්හාව ගැන මාහැඟි ධර්ම දේශනාවක් පැවැත් වූ අපවත් වී වදාළ අතිපූජණීය නා උයනේ ශ්‍රී අරියධම්ම අනුනායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට පැතුම් පරිදි මතු ලොව්තුරා බුද්ධත්වය අවබෝධ කරගැනීම පිණිසත්, මෙම දහම් පොත් බෙදාහැරීමෙන් රැස් කරගන්නා වූ ධර්ම දානමය කුසලානිසංසය හේතු උපනිශ්‍රය වේවා කියා පින් අනුමෝදන් කරමි. එමෙන්ම ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව නියෝජනය කරමින් වැඩ සිට අපවත් වී වදාළා වූ අනෙකුත් ස්වාමීන් වහන්සේලා ද ඇතුළු කොට මේ ගෞතම බුදු සසුනෙහි මහණදම් පුරා අපවත් වී වදාළා වූ සියලුම ස්වාමීන් වහන්සේලාට ද මෙම ධර්ම දානමය කුසලය එකසේ අත්පත් වීමෙන් සසර දුක් ගිවන්කර නිවන් අවබෝධ කරගන්න ලැබේවා!

සුජීවත්ව මහණදම් පුරන නා උයන ආරණ්‍ය සේනාසනයේ කෘත්‍යාධිකාරි කම්මට්ඨානාචාර්ය අතිපූජණීය අඟුල්ගමුවේ අරියනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේට නිරෝගී සුව දීර්ඝායුෂ ලැබීම පිණිසත්, දේශීය හා විදේශීය ගිහි-පැවිදි පින්වතුන්ට සාසනික වශයෙන් පිහිටාධාර වෙමින් තව තවත් සාසනික සේවාවන්හි යෙදීම පිණිසත්, ප්‍රාර්ථණීය බෝධියානයකට අනුව නිවන් අවබෝධ කරගැනීම පිණිසත් මෙම ධර්ම දානමය කුසල ශක්තිය ද ත්‍රිවිධ රත්නයේ පිහිට ආශීර්වාදය හා දෙවියන්ගේ දැහැමි රැකවරණය ද ලැබේවා කියා ගෞරවයෙන් යුතුව පුණ්‍යානුමෝදනා කරමි. තව ද, නා උයන ආරණ්‍යවාසී සියලුම බුද්ධ පුත්‍රයන් වහන්සේලාට උත්කෘෂ්ඨ ලෙස උතුම් ලෙස මහණදම් පුරා ගැනීම පිණිසත්, සමථ-විපස්සනා ඥාණ දියුණු කරගැනීම පිණිසත්, ප්‍රාර්ථනා පරිදි අසංඛත නිර්වාණ ධාතුව සාක්ෂාත් කරගෙන සංසාර දුකින් එතෙර වීම පිණිසත් මෙම ධර්ම දානමය කුසල ශක්තිය හේතු වාසනා වේවා කියා පුණ්‍යානුමෝදනා කරමි. එමෙන්ම විගොඩ ධම්මයුක්තිකාරාමාධිපති පරිවේණාධිපති ශාස්ත්‍රපති පූජණීය ඕවිටගමුවේ මේධාවි නායක ස්වාමීන් වහන්සේට හා කෘත්‍යාධිකාරි පරිවේණාධිපති පූජණීය මොරගහපල්ලමේ ශාන්ත ස්වාමීන් වහන්සේට නිරෝගී සුව හා දිගාසිරි ලබන්නටත්, තව තවත් සාසනික සේවාවන්හි නියැළීමටත්, පැතුම් පරිදි ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුව අවබෝධ කරගැනීමටත් මෙම ධර්ම දාන කුසලානිසංසය පිහිටාධාර වේවා!


විශේෂයෙන්ම මෙම දහම් පොත් මුද්‍රණය කිරීම සඳහා සෝදුපත් බැලීමෙන් සහය වූ පූජණීය දිද්දෙණියේ අරියදස්සන ස්වාමීන් වහන්සේටත්, දහම් පොත් මුද්රණය කිරීමට අවශ්‍ය කරන “සීඩී තැටිය” පිළියෙළ කර දුන් පූජණීය ගලගෙදර තික්ඛින්ද්‍රිය ස්වාමීන් වහන්සේටත්, මා හට මෙම ධර්මදාන කුසලය සිදු කරගැනීම සඳහා උදව් උපකාර කළ මාගේ පැවිදි පුත්‍ර ස්වාමීන් වහන්සේටත්, අපට හිතෛෂී පූජණීය රම්මුතුගල බුද්ධවංස ස්වාමීන් වහන්සේටත් නිරෝගී සුව දීර්ඝායුෂ

ලැබේවා! උත්කෘෂ්ඨ ලෙස මහණදම් පුරා ගැනීම පිණිසත්, සීල-සමාධි-ප්‍රඥා ගුණ පූරණය කරගෙන සුවසේම නිවන් අවබෝධ කරගෙන සසර දුකින් එතෙර වීම පිණිසත් මෙම ධර්ම දානමය කුසල ශක්තිය හේතු උපනිශ්‍රය වේවා!

මීට වසර දහඅටකට පෙර මිය පරලොව ගිය මාගේ ස්වාමි පුරුෂයා ද, ඔහුගේ දෙමව්පියන් හා මාගේ දෙමව්පියන් ද ඇතුළු කොට පරලොව සැපත් සියලුම ඥාතීන්ට මෙම ධර්ම දානමය කුසලානිසංසය අනුමෝදන් කරමි. ඔවුන් සැමගේ ආත්මභාවයන් සැපවත් වෙත්වා! සුවසේ පාරමී දහම් පුරාගෙන සසර දුකින් අත මිදෙත්වා! එමෙන්ම ආත්මාරක්ෂක, ශාසනාරක්ෂක ආදී සියලුම සම්‍යක්දෘෂ්ටික දිව්‍යරාජ සමූහයා ද සතුටු සිතින් මෙම කුසල් අනුමෝදන් වීමෙන් දිව්‍යමය ඓශ්වර්යයෙන් වැඩෙත්වා! පතන්නා වූ බෝධියානයකින් නිවන් සුව ලබත්වා!

මෙම ධර්මදාන කුසල ශක්තියේ බලයෙන් මාගේ දරුවන්ටත්, මුනුබුරු-මිනිබිරියන්ටත් සෙතක් ශාන්තියක් යහපතක්ම වේවා! ඔවුන්ගේ රැකීරක්ෂා කටයුතු ද ව්‍යාපාර කටයුතු හා අධ්‍යාපන කටයුතු ද පුරපස සඳමඩල මෙන් අභිවර්ධනය වේවා! සසර කතරින් එතෙර වීම පිණිස ද මෙම කුසලය හේතු වාසනා වේවා! තව ද, සුජීවත්ව සිටින අනිකුත් ඥාති හිතමිත්‍රාදීන්ටත්, මෙම දහම් පොත කියවා බලන ඔබ සැමටත්, මෙම දහම් පොත් මුද්‍රණය කොට බෙදාහරින මා හටත් දස සංයෝජන ධර්ම ප්‍රහාණය කොට චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කරගෙන තණ්හා ක්ෂය සංඛ්‍යාත ශාන්ත නිර්වාණ ධාතුව සුවසේම අවබෝධ කරගැනීම පිණිස මෙම ධර්ම දානමය කුසලානිසංසය පිහිටාධාර වේවා කියා ප්‍රාර්ථනා කරමි.

මෙයට,<br>
සසුන් ලැදි-පින් කැමති,<br>
උපාසිකා මතාවක්.<br>
"සඳගිර"<br>
දොරණගොඩ,<br>
බෙම්මුල්ල.



අතිපූජනීය නා උයනේ අරියධම්ම අනුනාහිමි

## තණ්හාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස///

“. . . ඉදං ඛෝ පන භික්ඛවේ දුක්ඛසමුදයං අරියසච්චං, යායං තණ්හා පෝනෝභවිකා නන්දිරාග සහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං? කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හාති . . .”

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ දසබලධාරී සර්වඥ රාජෝත්තමයාණන් විසින් දසදහසක් ලෝක ධාතූන්ට එක හා සමානව ඇසෙන සේ දේශනා කරන ලද ප්‍රථම දේශනාව වන ධම්මචක්කපවත්තන සූත්‍රාන්ත දේශනාවට අයිති කෙටි සූත්‍ර පාඨයක් මේ දේශනා වුණේ. අද දින දේශනය සඳහා මාතෘකාවට යෙදී තිබෙන්නේ තණ්හාව ගැනයි. ඒ නිසා මේ පාඨයට අනුව ධර්මානුශාසනාවට සවන් දෙමු.

“ඉදං ඛෝ පන භික්ඛවේ දුක්ඛසමුදයං අරියසච්චං” මහණෙනි! මේ කියනු ලබන්නේ දුක්ඛ සමුදය ආර්ය සත්‍යයයි. “යායං තණ්හා පෝනෝභවිකා නන්දිරාග සහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං?” “යායං තණ්හා” යම් මේ තණ්හාවක් වෙනවා, “නන්දිරාග

සහගතා'' ප්‍රීතිය සහිතව, සප්‍රීතික නම් වූ නන්දිරාගයක් සහිතව, ''පෝනෝභවිකා'' නැවත නැවත පුනර්භවය ගෙන දෙන්නා වූ, ''තත්‍රතත්‍රාභිනන්දිනී'' ඒ ඒ තැන ප්‍රීතිමත්ව ඇලෙන්නා වූ යම් තණ්හාවක් වේ නම් එය, කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා නමින් හැඳින්වෙනවා. මේකයි දුක්ඛ සමුදය ආර්ය සත්‍යය හැටියට බුදුරජාණන් වහන්සේ දේශනා කළේ.

''පෝනෝභවිකා'' කියන්නේ නැවත නැවත පුනර්භවය ගෙන දෙනවා. ''නන්දිරාග සහගතා'' කියන්නේ ප්‍රීතිමත්ව ඇලීමෙන් යුක්ත වෙනවා. ඒ වගේම ''තත්‍රතත්‍රාභිනන්දිනී'' නරකාදියෙහි උපන්නත් ඒ ඒ තැන සිත ඇළෙනවා. එවැනි තණ්හා තුනයි තියෙන්නේ. කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා. මේ සමුදය සත්‍යය හැටියට ප්‍රධාන වශයෙන් ගැනෙන්නේ තණ්හාවයි. ඒක නිසා තමයි මේ පද තුනකින් දේශනා කොට වදාළෙ. 'සමුදය' කියන වචනෙ බොහෝ දෙනාට පළපුරුදු වචනයක්. 'සමුදය' කියන්නේ පද තුනක එකතුවෙන් හැදිච්ච වචනයක්. සං+උ+අය කියන පද තුනක එකතුවෙන් තමයි සමුදය කියලා හැදුණෙ. 'සං' කියන උපසර්ගය, 'උ' කියන උපසර්ගය, 'අය' කියන නාමපදය, මේ තුන සන්ධි වෙනවා. සං, උ කියන අතරට 'ම්' ආදේශ වෙනවා බින්දුවට. ඊළඟට 'අය' කියන තැන දී 'ද්' ආගම වෙනවා. මේකෙ තේරුම, 'සං' කියන්නේ සංයුක්ත, සංගම්ම ආදී තැන්වල වාගේ 'එකතුව' කියන අර්ථයයි. එකතුවට කියනවා 'සං' කියන උපසර්ගය. 'උ' කියන්නේ උප්පාද, උදිත, උප්පන්න ඔය වාගේ යමක් පහළ වීමට කියනවා 'උ' කියන උපසර්ගය. 'අය' කියන්නේ හේතුව, කාරණය, නිදානය කියන තේරුමයි. එතකොට පද තුන එකතු වුනහම, හේතු රාශියක් එකතු වීමෙන් දුක උපදවන එකයි,

හේතු රාශියක් හේතුවෙන් මේ පඤ්ච උපාදානස්කන්ධ දුක උපදවන එකයි "සමුදය" කියන්නේ. එනම් මෙතන තණ්හාවටම නමක් සමුදය කියලා කියන්නේ.

බුදුරජාණන් වහන්සේ බොහෝ සූත්‍ර දේශනාවල මේ තණ්හාව පිළිබඳව දේශනා කරලා තියෙනවා. ධම්මපදයෙ පියවර්ගයේ තියෙනවා ගාථාවක්,

තණ්හාය ජායතී සෝකෝ - තණ්හාය ජායතී භයං
තණ්හාය විප්පමුත්තස්ස - නත්ථි සෝකෝ කුතෝ
භයං

තණ්හාව නිසා සෝකය හටගන්නවා, තණ්හාව නිසා භය හටගන්නවා, තණ්හාවෙන් මිදුණ තැනැත්තාට සෝකයක් නැත, භයක් ද නැත.

දිනක් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර කුඹුරක් අයිනෙන් වඩිනවා. කුඹුරු හිමි බ්‍රාහ්මණයෙක් පළමුවෙන්ම කුඹුරේ වැඩ පටන්ගන්නවා. කුඹුරේ තියෙන ගස් පැළැටි ඉවත් කරමින් සීසෑමට සූදානම් වෙනවා. ඉතින් බුදුරජාණන් වහන්සේ ඇහුවා "මොකද මේ කරන්නේ?" "ස්වාමීනි! මම මේ කුඹුර ගෙවඩන්න හදනවා, වැඩ පටන්ගන්න හදනවා." ඊළඟට සීසාන දවසෙත් බුදුරජාණන් වහන්සේ වැඩම කළා. එදත් ඇවිල්ලා ඇහුවා "මොකද මේ කරන්නේ?" "ස්වාමීනි! මම සීසානවා." ඔහොම එක එක කටයුත්තක් ගානෙ බුදුරජාණන් වහන්සේ කුඹුරට වැඩම කළානෙ. ඒක පුදුම දෙයක්. උන්වහන්සේගේ මහා කරුණාව. බුදුඇසින් දැක වදාළා මේ කෙනාට යම් දවසක දී මාර්ගඵල අවබෝධ කරගන්න ලැබෙන බව. ඔය විදිහට කීප සැරයක් ආවහම අන්තිමේ දී මොකද වුණේ. ගොයම් පැහිලා කපන්න සුදුසු වේලාවේ දී විශාල ගංවතුරක් ඇවිල්ලා ගොයම් ඔක්කොම ගහගෙන ගියා. පස්සෙ බුදුරජාණන් වහන්සේ ඔහුගේ නිවසට වැඩියා. මේ ඇත්තා කිකටට අත තියාගෙන

බොහොම ශෝකයෙන් ඉන්නවා. නමුත් මේ තැනැත්තා හිතාගෙන සිටියෙ, හිතලා තියෙන්නෙ ඉතාම ලොකු දෙයක්. “මම මේ කුඹුරේ අස්වැන්න නෙළාගත්තහම බුදුරජාණන් වහන්සේටත් කොටසක් දෙනවා” කියලා හිතාගෙන සිටියා. ඉතින් මේ තැනැත්තා ඒ වෙලාවේ බොහොම ශෝකයෙන් හිටියෙ, සිතූපැතූ සියල්ලම නිෂ්ඵල වුණා කියලා. ඉතින් බුදුරජාණන් වහන්සේ ඇහුවා “මොකද බ්‍රාහ්මණයො?” “අනේ ස්වාමීනි! මම ලොකු බලාපොරොත්තුවකින් ගොවිතැන් කළා. එක වී ඇටයක්වත් ගන්න ලැබුණෙ නැහැ, ගොයම් ඔක්කොම හෝදාගෙන ගියා ගංවතුරට. එකෙන් මට මහා තැවිල්ලක් ආවා. මට භයක් ඇති වුණා, මම ජීවත් වෙන්නෙ කොහොමද කියන භය. ඒ වගේම මම සිතූ දේ කරන්න නොහැකි වුණ නිසා ශෝකයක් ඇවිල්ලා.” එතකොට බුදුරජාණන් වහන්සේ ඉහත සඳහන් ගාථාව දේශනා කළා. ඒ දේශනයෙන් ඔහු මගඵල නිවන් ලැබුවා. මේ කාරණය නිසා තමයි කිහිප වාරයක් කුඹුරට වැඩියෙ. ඔය වගේ බුදුරජාණන් වහන්සේ තණ්හාව මුල්කොට ඇති දුක පහදා දෙමින් අනන්ත අපරිමාණ ජනතාවක් දුකින් මුදවලා තියෙනවා.

දැන් මේ තණ්හාව කියන එක පටිච්ච සමුප්පාදයේ තියෙනවා ‘වේදනා පච්චයා තණ්හා’ කියලා. යම් කිසි වින්දනයක සැප හෝ දුක හෝ මැදහත් හෝ වින්දනයක් තියෙනවා නම් තණ්හාව එතන ඇති වෙනවාමයි.

දුක්ඛී සුඛං පත්ථයති - සුඛී භියෝ’පි ඉච්ඡති
උපෙක්ඛා පන සන්තත්තා - සුඛමිච්චේව
භාසිතා

කියලා අට්ඨකතාවක දැක්වෙනවා. “දුක්ඛී සුඛං පත්ථයති” යම් කෙනෙකුට දුක් වේදනාවක් තියෙනවා. ඒ දුක් වේදනාව තියෙන කොට ඒ ඇත්තා තණ්හාවෙන් සිතනවා, අනේ මට දුකක් නැතිව සැප ලැබේවා. අන්න දුකට පත් වූ තැනැත්තා සැප හිතනවා. ධනය නැති එක්කෙනා ධනය නැතිව දුක් විදින කොට හිතනවා මට ධනය ලැබේවා. ඒ වගේම රෝගයක් තියෙන එක්කෙනා හිතනවා, අනේ මට රෝගයක් නැතිව නිරෝගී ජීවිතයක්, නිරෝගී කයක් ලැබේවා. අන්න තණ්හාවෙන් හිතන හැටි. ඒවා ධර්මතා වශයෙන් හිතන්නෙ නෑ. ඒවාගේම තමා කැමති කැමති දේවල් හිතනවා දුකට පත් වූ අය. “සුඛී භියොා්පි ඉච්ඡති” යම් කෙනෙක් සැපවත්ව ඉන්නවා. සැපවත්ව ඉන්න කෙනාට නැවත නැවතත් ඒ ගැන ආශාව ඇතිවෙලා තව තවත් ඒවා ලැබෙන්නට ඕනෑ, තව තවත් මට ලැබෙන්නට ඕනෑ කියලා හිතනවා. අන්න ‘සුඛී භියොා්පි ඉච්ඡති.’ ඒත් වේදනා පච්චයා තණ්හා. “උපෙක්ඛා පන සන්තත්තා - සුඛමිච්චේව භාසිතා” ඒ කිව්වෙ, උපේක්ඛා වේදනාව ශාන්ත එකක්, ඒකත් සැපයටම සම්බන්ධයි. ඒ නිසා සැපයෙන් තව තවත් සැප පතන්නා වාගේ උපේක්ඛා වින්දනයෙනුත් සැප ප්‍රාර්ථනා කරනවා.

රට්ඨපාල ස්වාමීන් වහන්සේ පැවිදි වෙන්න ඉස්සර වෙලා, රට්ඨපාල කුලපුත්‍රයාට බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබුණා දහම් පද හතරක්. ඉන් එක දහම් පදයක තියෙනවා “ඌණෝ ලෝකෝ අතිත්තෝ තණ්හා දාසෝ” කියලා. ‘ඌණෝ ලෝකෝ’ ලෝක සත්වයා කවදාවත් පිරිලා නෑ, හැමදාම අඩුපාඩු සහිතයි,

ඕනෑකම්වලින් අඩුපාඩුයි, ඕනෑකම්වලින් පිරෙන්නේ නෑ. ‘අතිත්තෝ’ කවදාවත් සෑහීමක් නෑ. කොච්චර සම්පත් ලැබුණත් සෑහීමක් නෑ. ‘තණ්හා දාසෝ’ තණ්හාවට දාසකම් කරනවා, වහල්කම් කරනවා.

බලන්න, අසංඛෙය්‍යයක් ආයුෂ ඇති කාලේ පහළ වුණා මහා මන්ධාතු කියලා සක්විති රජ තුමෙක්. මුල්ම ආදි කල්පයේ රජ කෙනෙක් මහා මන්ධාතු. මනුෂ්‍යයන්ගේ ඒ කාලේ පරමායුෂ අවුරුදු අසංඛෙය්‍යයක් (එකයි’ බිංදු එකසිය හතළිහක්). ඉතින් මේ රජ්ජුරුවෝ දීර්ඝ කාලයක් සම්පත් විඳලා ඇමතියන්ගෙන් ඇහුවා කොහෙද මීට වඩා සම්පත් තියෙන්නේ කියලා. ඒ මොකද, ඒ රජ්ජුරුවන් ස්නානය කරලා අහස දෙස බැලුවහම යොදුනක් මානේ රන් කහවණු වහිනවා. එතරම් පුණ්‍ය ලාභයක් තියෙන කෙනෙක්. ඒ වුණත් මනුෂ්‍ය ලෝකයේ තියෙන මේ ඉන්ද්‍රියන් පිනවන සැප සම්පත් මදිවෙලා ඇමතියන්ගෙන් අහලා දැනගෙන, චාතුර්මහාරාජික දිව්‍ය ලෝකයට ගියා චක්‍රරත්නයේ අනුභාවයෙන්. හැබැයි දෙව් ලොවට යන කොට මනුෂ්‍ය ශරීරය වෙනුවට දිව්‍ය හා සමාන ශරීරයක් ඇති වුණා. ඊළඟට සතරවරම් දෙවියෝ මෙතුමා පිළිගෙන බොහොම සම්පත් දුන්නා. සතරවරම් දෙවියන්ට වඩා සම්පත් බහුලයි එවකට මනුෂ්‍යයන්ගේ සම්පත්. එහෙත් දීර්ඝ කාලයක් දෙව් සැප විඳලා විඳලා එතනින් දැන ගත්තා තව්තිසා භවනේ මීට වඩා සම්පත් තියෙනවා කියලා. ඒ වෙලාවේ චක්‍රරත්නයෙන් ඊට වඩා ඉහළට යන්න බැරි නිසා මෙතුමාගේ ඍධියෙන් තව්තිසා භවනට ගියා. සක්දෙව් රජ්ජුරුවෝ එතුමාගේ සක්‍ර සම්පත්තියෙන් භාගයක් මෙතුමාට පිළිගැන්වුවා. දැන් දෙව් කෙනෙක් හා සමානව, සක්දෙවිඳු හා සමානව සැප විඳිනවා. සක්දෙව් රජතුමාගේ ආයුෂ අඩු වැඩියක් නැනේ. එය අවුරුදු තුන්කෝටි

හැටලක්ෂයයි. සක්දෙවිවරු චුත වෙලා ගියා තිස්හය දෙනෙක්. එතෙක් මෙතුමා දෙව්ලොව සිටියා. අන්තිමේ දී තිස්හත්වන සක්දෙව් රජු පහළ වන කාලයේ මෙතුමා හිතුවා "මට මේ භාගෙට වඩා සියලුම සක්‍ර සම්පත් ලැබුණොත් හොඳයි" කියලා. ඉතින් මේ අනුන්ගේ දේට ආශාවක් නෙ උපන්නේ. අන්තිමේ දී ඒ අභිජ්ඣා කියන දැඩි ලෝභය නිසා මොකද සිද්ධ වුණේ? ආයුෂ පිරිහුණා. ආයුෂ පිරිහිලා මනුෂ්‍ය ලෝකයට පතිත වුණා. පුළුන් රොදක් එන්නා වාගේ පහත් වෙලා ආවා. තමන්ගේ පින නිසා එක පාරටම පහළට වැටෙන්නෙ නෑ. පුළුන් රොදක් වාගේ පහත් වෙලා ඇවිල්ලා රජ්ජුරුවන්ගේ උයනේ ම රැඳුණා. ඒ වෙනකොට මැති ඇමතිවරු, බිසෝවරු, ඒ වගේම රාජපුත්‍රයෝ ඔක්කොම ආවා. ඇවිල්ලා රජ්ජුරුවන්ගේ අභාවය ආසන්න බව කවුරුත් තේරුම් අරගෙන ඇහුවා, "ඔබ වහන්සේගේ ඇවෑමෙන් පසු අපි රටට ලෝකයට කුමක් ද කිව යුත්තෙ?" "දරුවෙනි! මෙහෙම කියන්න, මේ සම්පත් ජාති කොපමණ ලැබුණත් සෑහීමක් නෑ. මම මෙච්චර මනුෂ්‍ය සම්පත් විඳලා විඳලා චාතුර්මහාරාජිකයට ගිහින් එහි සැප වින්දා, සක්‍ර භවනට ගිහින් සක්දෙව් රජවරු තිස්හය දෙනෙක් චුත වන තුරු එහි සම්පත් වින්දා, මට ඒත් මදි වුණා. ඒ නිසා මේ තණ්හාව කියන එක කවදාවත් සෑහීමකට පත් වෙන්නේ නැති බව තේරුම් අරගෙන මම ඒ ප්‍රකාශය කළ බව කාටත් කියන්න" යි කියලා කිව්වා. එතුමා එතනින් චුත වෙලා ගිහිල්ලා නැවත සුගතියක උපන්නා. සක්විති රජ කෙනෙක් මිය ගොස් කෙළින්ම අපායට යන්නේ නෑ. එතුමා වෙන කවුරුත් නෙවෙයි, අපේ බෝධිසත්වයෝ 'මහා මන්ධාතු' රජු වෙලා සිටියෙ. මොකක්ද මේකට හේතුව? පෙර ජාතියක දී, පෙර බුදු සසුනක දී මෙතුමා බොහොම දුප්පත් හිඟන්නෙක් වෙලා හිටියා. සමහර විට එහෙම වෙනවා කළ අකුසල කර්මයක් නිසා. මේ හිඟන්නාට කවදාවත් දානයක්

පූජා කරගන්න පින නෑ. නමුත් එවකට රජවරු ඇමතිවරු නොයෙක් ප්‍රභූවරු දන් පින්කම් කරනවා. මෙතුමා සිතුවා "මට මෙහෙම වුණේ මගේ අතින් දන් දීලා අඩුවෙලා නිසානෙ. දානයක් දෙන්න ඕනෑ." එහෙම හිතලා හිඟමනේ යන කොට බඳුනකට හම්බ වුණා මෑ ඇට පාත්‍රයක්ම. කල්පනා කළා අද නම් දානයක් දෙන්න පුළුවන් කියලා විහාරයට ගියා. කිට්ටුවෙන්න බෑ. මොකද විශාල පිරිසක් ඇවිල්ලා දන් පිළිගන්වන්න, ළං වෙන්නත් බෑ මෙතුමාට. මෙතුමා සිතුවා "මම මෙතන ඉඳලා අහසින් විසි කරලා දන් දෙන්නම්" කියලා. අධිෂ්ඨානයක් කරගත්තා "මා මේ දානය පරිත්‍යාග කරනු ලබන්නේ සියල්ල දන්න සම්මා සම්බුදු කෙනෙකුන් වහන්සේට නම්, ඒ වගේම නික්ලේශී රහතන් වහන්සේලාට නම් මගේ මේ මෑ ඇට එක එකක් හරි, එක එක පාත්‍රයට වැටේවා" කියලා අහසට දැම්මා. ඇත්තෙන්ම බුද්ධ අධිෂ්ඨාන බලයත්, මෙතුමාගේ ශ්‍රද්ධාවත් නිසා හැම මෑ ඇටයක්ම එක එක පාත්‍රවලට වැටුණා. බුදුරජාණන් වහන්සේ මේක පේන්නත් සැළැස්සුවා එතුමාගේ සිතේ කුසලය වැඩෙන්න. මේ බෝධිසම්භාර පුරන කෙනෙක් නේ. අන්තිමේ දී එදා එතුමා ප්‍රාර්ථනා කළාලු, "මේ කුසල බලයෙන් මට දෙව්ලොව මනුලොව කාමභෝගීන්ගෙන් අග්‍ර වෙන්න ලැබේවා. මම අහස දෙස බැලුවහම රන් කහවණු වැසි වසීවා." ඔන්න ඔය විදිහට ප්‍රාර්ථනාවක් කළා. තණ්හාවනේ. තමා දුකින් ඉන්න නිසා අර විදිහෙ සම්පත් පැතුවා. ඒවා අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දන්නෙ නෑ. ඒ වෙලාවේ නැතිබැරි කමට ආශාව වැඩි වුණා. අන්න ඒ පින නිසා තමයි පසු කාලෙක මේ ආදි කල්පයෙහි දීර්ඝායුෂ කාලයේ දී මහා මන්ධාතු නමින් රජ වෙලා අහස දෙස බැලුවහම රන් කහවණු වැස්සෙ. ඒ වගේම දෙව්ලොව දෙකකටම ගිහින් සම්පත් විඳලත් සෑහීමකට පත් වුණේ නෑ. අර තණ්හාවේ තියෙන බරපතලකම නිසා. නමුත්

උන්වහන්සේ ඒ ජීවිතයේ දී ම එය තේරුම් අරගෙන පිරිසිදු සිතින් මිය පරලොව ගියා.

න කහාපණ වස්සේන - තිත්ති කාමේසු විජ්ජති
අප්පස්සාදා දුඛා කාමා - ඉති විඤ්ඤාය පණ්ඩිතෝ

අපි දිබ්බේසු කාමේසු - රතිං සෝ නාධිගච්ඡති
තණ්හක්ඛයරතෝ හෝති - සම්මා සම්බුද්ධසාවකෝ

කියලා ඒ වෙනුවෙන් බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනාවකුත් කළා. කහවණු වැස්සකිනුත්, දිව්‍ය සම්පත් වුණත් සෑහීමක් නෑ කාටවත්. ඒ නිසා ඤාණවන්තයෝ මේ සම්පත්වලින් සෑහීමක් නොවන බව තේරුම් අරගෙන තණ්හා ක්ෂය සංඛ්‍යාත නිවනේ සිත් අළවා කුසල් පාරමී පිරිය යුතුයි කියලා අනුශාසනා කොට වදාළා.

අනික් කාරණය, මේ තණ්හාවේ තියෙන බරපතලකම කොච්චර ද කියනවා නම් ධ්‍යාන වඩා බඹලොව ගියත් ආයෙමත් අපායට පවා යන්න සිද්ධ වෙනවා.

යථාපි මූලේ අනුපද්දවේ දළ්හේ
ඡින්නෝපි රුක්ඛෝ පුනරේව රූහති
ඒවම්පි තණ්හානුසයේ අනූහතේ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං

මේ ගාථාවෙන් කියවෙන්නේ, මහා ගහක මුල තියෙද්දී අතුපතර සිඳබිඳ දැම්මට ආයෙමත් ඒ ගහ ළියලනවා අතුපතර වැඩෙනවා, තිබුණටත් වඩා වැඩෙනවා. ඒ වගේ තණ්හා අනුශය සිඳින්නේ නැතිව ධ්‍යාන වඩා බඹලොව ගියත්, ආයෙමත් මේ සතර අපා දුක පවා ලැබෙනවා. ඒකයි උන්වහන්සේ ඉහත ගාථාවෙන් දේශනා කළේ.

මේ පින්වතුන්, සූකර පෝතිකාවගේ කතාව අහලා ඇතිනෙ. ඇය කාශ්‍යප බුදුසසුන කාලයේ දී කිකිළියක්. මේ කිකිළිය මෙහෙණින් වහන්සේලාගේ ආශ්‍රමයක් ආශ්‍රිතව හැසිරුණා. නිතර නිතර මෙහෙණින් වහන්සේලා දැකීමෙන් සිත පහදා ගත්තා. පසුව මිය ගොස් රජකුමරියක් වෙලා ඒ නගරයේම උපන්නා 'උබ්බරී' කියලා. අර පෙර ජාතියේ බණ ඇසූ පිනෙන් පැවිදි වෙන්න ආශා වෙලා මෙහෙණි සස්නෙ පැවිදි වුණා. පැවිදි වෙලා එක දවසක් වැසිකිළි වළක පණු රොත්තක් දැකලා පුළවක සඤ්ඤාවෙන් ප්‍රථම ධ්‍යානය උපදවා ගත්තා. පසු කාලයක දී මිය ගොස් බ්‍රහ්ම පාරිසජ්ජ බඹතලයේ ඉපදුණා. බ්‍රහ්ම පාරිසජ්ජ බඹතලයේ සැප විඳලා ආයෙමත් ආවා බරණැස් නුවරට, සිටුකුමාරියක් වෙලා උපන්නා. ඔහොම වාර ගණනක් ඇවිල්ලා මොකද වුණේ? අපේ බුදුරජාණන් වහන්සේගේ කාලයේ රජගහනුවර ඊරි පැටික්කියක් වෙලා ඉපදුණා. ඒ ඊරි පැටික්කිව දැකලා තමයි බුදුරජාණන් වහන්සේ සිනහා පහළ කරලා ඉහත ගාථාව දේශනා කළේ. පසු කලෙක ස්වර්ණදීපයේ රාජකුමාරියක් වුණා, සුප්පාරක පටුනේ වැදි දියණියක් වුණා, වෙළඳ දියණියක් වුණා. ඔහොම වාර එකොළහක්ම තැන් තැන්වල ඉපදිලා ඇවිල්ලා අපේ ලංකාවේ උපන්නා ස්ත්‍රියක් වෙලා. ලංකාවේ ඉපදිලා ලකුණ්ඩක අතිම්බර කියන අමාත්‍ය තුමාගේ බිරිඳ බවට පත් වෙලා හිටියා අනුරාධපුරයේ. එක දවසක් කෝටිපබ්බත කියන ආරණ්‍යවාසී මහා අනුරුද්ධ ස්වාමීන් වහන්සේ පිණ්ඩපාතෙ වඩින කොට මෙතුමිය පිණ්ඩපාතෙ දුන්නා. උන්වහන්සේ ආපසු විහාරස්ථානයට ගිහිල්ලා මේ ප්‍රවෘත්තිය සඟ මැද කිව්වා, "බුදුරජාණන් වහන්සේ එදා සිනහා පහළ කරපු ඊරි පැටික්කි අද මට දානෙ දුන්නා" කියලා. මෙතුමියට මේක ආරංචි වෙලා බොහොම

සංවේගයක් ඇතිවෙන කොට පෙර විසූ ජාති දක්නා නුවණ පහළ වුණා, ජාතිස්මරණ ඥාණය. එතුමිය බලවත් ලැජ්ජාවට, සංවේගයට පත් වෙලා තමාගේ ස්වාමි පුරුෂයාගෙන් අවසර ගෙන මෙහෙණි සස්නෙහි පැවිදි වුණා. පැවිදි වෙලා තිස්සමහාරාම විහාරයේ දී සතිපට්ඨාන සූත්‍රය අහලා සෝවාන් වුණා. ඊළඟට කල්ලමහාවිහාර සේනාසනයේ දී ආසිවිසෝපම සූත්‍රය අහලා සියලු කෙළෙස් නසා අර්හත්වයට පත් වුණා. පසු කාලයක දී එතුමිය පිරිණිවන්පාන කොට අර සියලුම ප්‍රවෘත්ති කියලා පිරිණිවන් පෑවා. එතන සඳහන් වෙනවා එදා බුදුරජාණන් වහන්සේ සිනහා පහළ කළේ, ගාථාවක් දේශනා කළේ මේ අනාගත හේතු සම්පත් දැකලයි කියලා. ඒ නිසා මේ විදිහේ කොච්චර ධ්‍යාන සම්පත් ලැබුවත්, අභිඥ්ඥා බල ලැබුවත්, භවාග්‍රයට ගියත් මේ තණ්හාව නොසිඳ සිටියොත් ආයෙමත් යනවා අපායට, ආයෙමත් සංසාර දුකට වැටෙනවා.

දැන් අපි සැමදෙනාම බඹතලය දක්වා ගිහින් තියෙනවා, පඤ්ච සුද්ධාවාසයට විතරයි ගිහින් නැත්තේ. නමුත් අපට භව සංසාරයේ අනාදිමත් කාලයක් බඹලොවට, සතර අපායට යන්න එන්න සිද්ධ වුණා. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කළා “මේ තණ්හාව අවබෝධ කරගන්න ඕනෑ, මේ තණ්හාව ප්‍රහාණය කරන්න ඕනෑ” කියලා.

දැන් අපි තණ්හාව කියන එකේ ධර්මතාව සළකා බලමු. මොකක්ද මේ තණ්හාව කියන්නේ? ලෝභ චෛතසිකයටයි. අකුසල චෛතසික දාහතරක් (14) තියෙනවනෙ. මෝහ, අහිරික, අනොත්තප්ප, උද්දච්ච කියලා හතරයි; ලෝභ, දිට්ඨි, මාන කියලා තුනයි; ථීන-මිද්ධ කියලා දෙකයි; දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච

කියලා හතරයි; විචිකිච්ඡාවයි පහයි. මේ සියල්ලම දාහතරයි. ඉතින් මේ ලෝභ චෛතසිකය තමයි තණ්හා නමින් ක්‍රියාකාරී වෙන්නෙ. ලෝභ චෛතසිකයට තියෙනවා නම් සියයක් (100). බුද්ධ ධර්මයේ කිසිම තැනක නෑ එකම ධර්මයකට නම් සීයක් දේශනා කළ තැනක්. මේ ලෝභය හඳුන්වන්න නම් සීයක් තියෙනවා. එය සඳහන් වී තිබෙන්නෙ "ධම්මසංගණීප්‍රකරණයෙ, නික්ෂේප කාණ්ඩයේ." එතරම් ක්‍රියාකාරිත්වයක් මේ ලෝභයේ පවතිනවා. ඒ නම් ලැබෙන්නෙ එක එක ක්‍රියාකාරිත්වය උඩයි. එතකොට ලෝභය පිළිබඳව බුදුරජාණන් වහන්සේ මෙහෙම දේශනා කරලා තියෙනවා.

'ලුබ්භතීති ලෝභෝ' ඇලෙන්නේනුයි ලෝභ නම් වේ.

'ආරම්මණ ගහණ ලක්ඛණෝ' අරමුණ අල්ල ගන්නවා.

කොහොමද කියනවා නම් මක්කටාලේපයක් වාගේ. වැදි පුත්‍රයෝ වඳුරන් අල්ලන්න ඇලෙන ජාති කොහොල්ලෑ වාගේ හදලා ලී දඬුවල අලවා ගස්වල අතු උඩ තබනවා. එතකොට වඳුරෝ ඇවිල්ලා ඒවා අල්ලනවා. අල්ලපු අල්ලපු අත ඇළෙනවා ගලවන්න බෑ. අතපය හතරම ඇලෙනවා. එතකොට කටින් අල්ලනවා, එතකොට මූණත් ඇළෙනවා. ඊට පස්සෙ වඳුරා ඇකිළිලා බිම වැටුණහම අල්ල ගන්නවා. අන්න ඒ වගේ ගලවන්න බැරි තරම් ඇලෙන මක්කටාලේපයක් වාගේ, වඳුරු ලහට්ටක් වාගේ අරමුණ තදින් අල්ල ගන්නවා. ඒකයි මේ කියවුණේ 'ආරම්මණ ගහණ ලක්ඛණෝ' කියලා. ඒ අරමුණ තදින්ම අල්ල ගන්නවා. එය තණ්හාවේ, ලෝභයේ ස්වභාවය. ඒ වගේම 'අභිසංගහණරසෝ තත්තකපාලේ මංසපේසි විය' මේ ලෝභය හෙවත් තණ්හාව අතිශයින්ම ඇළී ගන්නවා,

කොහොමද කියනව නම් රත් වූ කබලකට දාපු මස්පිඩු වාගේ. රත් වූ කබලකට අමු මස් පිඩුවක් දැම්මා නම් ඒ මස් පිඩුව ඇලෙනවා, පිච්චෙනකං ඇලෙනවා.

ඊළඟට එහි වැටහෙන ආකාරය සළකා බලමු. 'අපරිච්චාගපච්චචුපට්ඨානෝ තේලඤ්ජනරාගෝ විය' ඒ කියන්නෙ මොනලෙසකින්වත් අත්හරින්නෙ නෑ. අත්හරින්න හිතක් නෑ. තමන් අල්ලගත්ත දෙය අත්හරින්නෙ නෑ. මේ තණ්හාවේ ලෝභයේ හැටි එහෙමයි. කොහොමද 'තේලඤ්ජනරාගෝ විය.' දැන් ඔය ඇඳුම්වල තෙල් පැල්ලම් හැදෙනවනේ. එහෙම නැත්නම් තෙල්වලින් හදනවනෙ 'තේලඤ්ජන' කියලා ඔය බුදුපිළිමවල, විශේෂ තිරවල ගාන සායමක්. ඒ සායම මොනලෙසකින්වත් සෝදන්න බෑ. ඒ තෙලුත් එක්ක නූල්වලට උරාගෙන තියෙන්නෙ. ඒ වගේ තමයි මේ තණ්හාව, මේ ලෝභය. තමන් අල්ල ගත්ත දෙය කිසිසේත්ම අත්හරින්නෙ නෑ. අල්ල ගත්ත තරමට අත්හරින්නෙ නැති එකයි ඒකෙ වැටහෙන ආකාරය. කුහුඹියෙකු මී පැණියට එකතු වෙනවා වගේ. කුහුඹියා මී පැණි බොන්න ගියහම ඒකෙ එරිලා මැරෙනවා, ගොඩ එන්න ලැබෙන්නෙ නෑ. ඒ වගේම මී මැස්සො මදවැට්ච්ච අලියගේ කණට රිංගනවා, කණට සමීප වෙනවා එවිට මී මැස්සො මැරී වැටෙනවා. ඒ වගේ තමයි මේ ලෝභය කියන එක, තණ්හාව කියන එක, තමන් අල්ල ගත්ත දේ අත්හරින්නේ නැතිව මැරෙනකම්ම අල්ල ගෙන ඉන්නවා.

ඊළඟට තියෙනවා ඒකෙ හේතු සාධක. මොකක් නිසා ද මේ තණ්හාව ලෝභය හටගන්නේ. "සංයෝජනීයේසු ධම්මේසු අස්සාද දස්සන පදට්ඨානෝ" ලෝකයේ තියෙනවා සංයෝජන ධර්ම කියලා කොටසක්,

දස සංයෝජන. ඒ දස සංයෝජන සම්බන්ධ දේවල්වල ආශ්වාදය දකිනවා. දස සංයෝජනයන්ට අරමුණු වන දේවල්, ඒ කියන්නෙ චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන ආදී දොළොස් ආයතනම මේ දස සංයෝජනයන්ට අරමුණු වෙනවනෙ. ඒ දස සංයෝජනයන්ට අරමුණු වෙනවා කියන්නේ, මේ ආත්ම භාවය පිළිබඳව ආශ්වාදය දකිනවා එහි ආදීනව දකින්නේ නෑ. ආශ්වාදය දැකීම නිසා තමයි මේ ලෝභය හටගන්නෙ.

එතකොට ඉස්සර බණ කතාවක් තියෙනවනෙ, සිවලෙක් ඇත් කුණකට ආශාවෙන් ඒ ඇතාගේ කුස තුළට ගිහින් අන්තිමේ දී විශාල විපත්තියකට භාජනය වුණා කියලා. ඒ වගේ තමයි. ඒ කියන්නෙ තමා එහි ආදීනව නොදැකීම නිසා ඒ ඒ තැන්වල ගිහින් ඇලෙනවා. ඒක නිසා තමයි ලෝභය තහවුරු වෙන්නෙ, නිදහන්ගත වෙන්නෙ.

මේ ලෝභය කියන එක අකුසල මූලයක්. අකුසල් පහළ වෙන්න හේතුවක්. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා "සිඝසෝතා නදී විය මහාසමුද්දං" කියලා. මහා සැඩ පහරක් ඇති ගංඟාවකට වැටිච්ච දේ මහ මුහුදට ගහගෙන යනවා වගේ මේ තණ්හා ස්‍රෝතයට (සැඩ පහරට) වැටෙන්නේ නම්, "අපායමේව ගහෙත්වා ගච්ඡති" අපා දුකටම ගෙනිහිල්ලා දානවා. එතරම් භයානක දෙයක් මේ ලෝභය.

දැන් අපි සළකා බලමු මේ ලෝභය තුන් ආකාරයකට බෙදුණේ කොහොමද කියලා. මේ ලෝභය හෙවත් තණ්හාව බෙදනවා කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා කියලා තුනකට. එතකොට මේ ලෝභයේ අවස්ථා තුනක් කියවුණානෙ. තවත් තියෙනවා හයක් රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා,

ඵොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා කියලා. තවත් බෙදිලා යනවා එකසිය අටකට (108). ඒ විදිහට ප්‍රභේද වෙනවා. තණ්හාව කියන එක එකක් වුණාට බෙදිලා යනවා.

කාමතණ්හා කියන්නේ, අවීචියේ පටන් පරනිම්මිත වසවර්තිය දක්වා කාමභූමි එකොළහක් (11) තියෙනවනෙ, ඒ කාමභූමි එකොළහේ තියෙන සම්පත්වලට ආශා කරනවා. අවීචියේ වුණත් ආශා කරනවා. අවීචියේ සම්පත් නෑ, සතර අපායේ සම්පත් නෑ නමුත් එතන උපන්නහම ඒකට ආශා කරන්න තරම් තණ්හාව බොහොම ළාමකයි. එතකොට මනුෂ්‍ය ලෝකය සහ දිව්‍ය ලෝක හය කියලා කාම ස්වර්ග හතක් තියෙනවනෙ, ඒවායේ සම්පත් ගැන ආශාව. ඒක තමයි කාමතණ්හා. එතකොට කාමාවචර සම්පත් පිළිබඳව ආශාවක් නම් ඒකට කියනවා කාමතණ්හා කියලා.

භවතණ්හා කියන්නේ, ලෝකයේ තියෙනවා ආත්ම භාවය පිළිබඳ ඇල්මක්; සමහර ඇත්තො ඒ ආත්ම භාවය සදාකාලිකයි කියලා පිළිගන්නවා. සදාකාලික, සැමකල්හි නොනැසී පවත්නා ආත්මයක් ඇතෙයි කියන එක, ඒක දෘෂ්ටිය. ඒකට කියනවා ශාස්වත දෘෂ්ටිය කියලා. ඒක මිශ්‍ර වෙනවා තණ්හාවට, ඒකත් එක්ක සම්ප්‍රයුක්ත වෙනවා. ඒ නිසා ශාස්වත දෘෂ්ටියත් සමග මිශ්‍ර වූ තණ්හාවට කියනවා භවතණ්හා කියලා. ඒ භවතණ්හාව තියෙන ඇත්තො, භවය නැත්නම් ආත්මභාවය සදාකාලිකයි කියලා සිතා ගන්නවා. එහෙම ඇත්තො කුසලුත් කරනවා, අකුසලුත් කරනවා. බොහෝ සෙයින් අකුසල් කරනවට වඩා කුසල් කරන්න පටන් ගන්නවා මේ භවතණ්හාව තියෙන අය. දැන් බ්‍රහ්මාගමේ ඇත්තො, බ්‍රහ්ම ලෝකය සදාකාලිකයි කියලා

සිතා ගෙන ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති පුරනවා. ඒ නිසා ඒ අයට අපායගාමී හේතුවක් වෙනවා මේ භවතණ්හාව.

විභවතණ්හා කියන්නේ, ආත්මභාවය මරණින් පසු ඉපදෙන්නෙ නෑ කියන උච්ඡේද දෘෂ්ටියත් එක්ක මිශ්‍ර වූ සම්ප්‍රයුක්ත වූ තණ්හාවයි. ඒ කියන්නෙ, කෙනෙකු මිය ගියාට පසු නැවත ඉපදීමක් නෑ කියලා දෘෂ්ටියක් තියෙනවා. ඒකට කියනවා උච්ඡේද දෘෂ්ටිය කියලා. ඒ උච්ඡේද දෘෂ්ටියෙන් යුක්ත වූ පුද්ගලයා සිතනවා, ආත්මභාවය මරණින් මතු සිදිලා-බිදිලා යනවා ඒක ආයෙ පහළ වෙන්නෙ නෑ කියලා. ඒක භෞතිකවාදය කියලත් හැඳින්වෙනව නේ. ඒ කියන්නෙ යම් කෙනෙකු මිය ගිය පසු ඔහුගේ පඨවි කොටස පොළවට ඇදගන්නවා, ආපෝ කොටස ජලයට ඇදගන්නවා, තේජෝ කොටස ගින්නට ඇදගන්නවා, වායෝ කොටස සුළඟට ඇදගන්නවා, එතකොට හිත (විඤ්ඤාණය) අහසට ඇදගන්නවා. කිසිවක් පරලොවට යන්නෙ නෑ, නැවත ඉපදීමක් නෑ කියලා හිතනවා. ඒක බරපතල දෘෂ්ටියක්. ඒක උච්ඡේද දෘෂ්ටිය. ඒ උච්ඡේද දෘෂ්ටිය තියෙන එක්කෙනා බොහෝ අකුසල් කරන්න ඉදිරිපත් වෙනවා. මොකද පරලොවක් පිළිගන්නෙ නැති නිසා බොහොම දාමරික අකුසල් පවා කරන්න පෙළඹෙනවා. ඒ නිසා ශාස්වත දෘෂ්ටියට වඩා බරපතලයි උච්ඡේද දෘෂ්ටිය. ඉතින් ඒ උච්ඡේද දෘෂ්ටියෙන් යුක්ත වූ තණ්හාවට කියනවා 'විභවතණ්හා' කියලා.

දැන් මේ කාම, භව, විභව කියන තණ්හා තුන (3), ඉහත කියන ලද රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, ඵොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා නමින් ද ගැනෙනවා. මෙතන හයක් තියෙනවනෙ (6); මේ හය ඒ තුනෙන් වැඩි වුණහම දහඅටක් වෙනවා ($6 \times 3 = 18$). ඒ

වගේම චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන කියන ආයතන හයටත් තුන් තුන් ආකාරයකින් (කාම, භව, විභව වශයෙන්) තණ්හාව පහළ වෙනවා. එතකොට ඒ ආයතන හය මේ තුනෙන් වැඩි වුණහම දහඅටක් වෙනවා (6 × 3 = 18). දැන් මේ දහඅටයි, ඉහත සඳහන් දහඅටයි එකතු වුණහම තිස්හයයි (36). මේ තිස්හය වැදෑරුම් තණ්හාව තුන් කාලයෙන් වැඩි වුණහම එකසිය අටක් (108) වෙනවා. ඒ කියන්නෙ, අතීත තිස්හයයි (36), වර්තමාන තිස්හයයි (36), අනාගත තිස්හයයි (36); එවිට තණ්හාව එකසියඅට වැදෑරුම් වෙනවා. බුදුරජාණන් වහන්සේ බොහෝ තැන්වලත්, ධම්මපදයේ තණ්හා වර්ගයේ ගාථා විසිහයකින් මේ තණ්හාව විස්තර කරලා තියෙනවා.

යස්ස ඡත්තිංසති සෝතා - මනාපසවනා භුසා
වාහා වහන්ති දුද්දිට්ඨිං - සංකප්පා රාගනිස්සිතා

"යස්ස ඡත්තිංසති සෝතා" මේ තිස්හය වැදෑරුම් තණ්හාවට කියනවා තණ්හා ස්‍රෝතය කියලා (ස්‍රෝතය කියන්නෙ සැඩපහරට). "මනාපසවනා භුසා" තමන් ඒ අරමුණු මනාප වශයෙන් අල්ල ගන්නවා, දැඩි ලෙස අල්ල ගන්නවා. "වාහා වහන්ති දුද්දිට්ඨිං" දෘෂ්ටි ඇති ඒ පුද්ගලයා ගහගෙන යනවා. "සංකප්පා රාගනිස්සිතා" නොයෙක් විදිහේ රාග සංකල්පනා ඇතිව ඔහු ගහගෙන යනවා මේ සැඩ ස්‍රෝතයෙන්, තණ්හා සැඩපහරින් ගහගෙන යනවා.

ඉතින් මේ වාගේ බුදුරජාණන් වහන්සේ දෙසූ දේශනා අනුව මේ තණ්හාව පඤ්ච උපාදානස්කන්ධ දුක්ඛය උපදවන ප්‍රධාන හේතුව කියලා දේශනා කළා. නමුත් තණ්හාව තනිවම නෙවෙයි මේ දුක්ඛය උපදවන්නෙ. තණ්හාවට සහයෝගය දෙනවා අවිද්‍යාව, උපාදානය,

කර්මභවය. මේ වගේ දේවල් උපකාර වෙනවා, සහයෝගය දෙනවා ප්‍රධාන වශයෙන්. අප්‍රධාන වශයෙන් අනිත් සියලුම අකුසල් තණ්හාවට සහයෝගය දෙනවා. ඒ නිසා මේ තණ්හාව දුක්ඛසමුදය සත්‍යය (දුක හට ගැනීමට හේතුව) හැටියට සඳහන් වෙනවා.

දැන් අපි සළකා බලමු මේ භාවනා පන්තිය අවසානයේ දී කිව්වා, “මේ භාවනා කාලය තුළ පහළ වූ චිත්ත, චෛතසික, භූතරූප, උපාදාරූප යන මේ නාමරූප ධර්මයෝ ඇතිව නැතිව යන බැවින් අනිත්‍යයි. ඇතිවීම් නැතිවීම් දෙකෙන් නිතරම පෙළෙන බැවින් දුකයි. තම තමන් කැමති සේ නොපවතින බැවින් අනාත්මයි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම නාමරූප සමූහය දුක්ඛ සත්‍යයයි. ඒ දුක නැවත නැවත උපදවන පූර්වභව තෘෂ්ණාව සමුදය සත්‍යයයි” කියලා කිව්වා. මොකක්ද මේ පූර්වභව තෘෂ්ණාව කියලා කියන්නේ? ඒ කියන්නෙ දැන් මේ වර්තමාන භවයෙහි අපි ඉපදී සිටින්නෙ කුසල විපාකයකින් නේ. මේ කුසල විපාකය ඇති වුණේ පෙර ජාතියේ දී අප කරගත්ත කුසල කර්මයක් නිසයි. ඒ කුසල කර්මය කිරීමේ දී අපට හේතු වුණා ධර්මතා පහක්. ඒවා තමයි අවිද්‍යා, තණ්හා, උපාදාන, සංස්කාර, කර්මභව. ඒ කියන්නෙ අප්‍රහීණ වශයෙන් තමාගේ හිතේ තණ්හාව තියෙනව නේ. දැන් අපි හිතනවා “මීට වැඩිය හොඳයි මම අහවල් ලෝකයේ උපන්නොත්, අහවල් විදිහට උපන්නොත්, මට රජකුමරෙක් වෙන්න ඇත්නම්, සිටු කෙනෙක් වෙන්න ඇත්නම්, ධනවත් කෙනෙක් වෙන්න ඇත්නම්, රූමත් කෙනෙක් වෙන්න

ඇත්නම්, නීතිඥයෙක් වෙන්න ඇත්නම්, නලුකාරයෙක් වෙන්න ඇත්නම්, පැවිද්දෙක් වෙන්න ඇත්නම්" ආදී වශයෙන් නොයෙක් දේවල් සිතනවා. අපි වුණත් එහෙම සිතනව නේ. අන්න ඒ විදිහට සිතන සිතුවිල්ල ඇති වුණේ ආශාව නිසා නේ. ඒ ආශාව ඇති වුණේ කුමක් නිසා ද? ඒ ඒ තත්වයන් අනිත්‍ය බව, දුක්ඛ බව, අනාත්ම බව නොදන්න නිසා. ඒකට කියනවා අවිද්‍යාව කියලා. ඒවා අනිත්‍ය බව, ත්‍රිලක්ෂණයට යටත් බව, වෙනස් වෙන බව දන්නෙ නෑ. ඒ නොදන්න බවට කියනවා අවිද්‍යාව කියලා. එතකොට ඒකම මට ඕනෑ කියලා හිතන කොට උපාදානය. ඊළඟට කුසලයක් කරගන්න හිතක් පහළ වෙනවා. ඊළඟට ඒ කුසල කර්මය රැස් කරනවා (කුසල කර්මයෙහි යෙදී සිටිනවා). ඒක කර්මය. ඒ කර්මය තමයි සංස්කාර. ඊළඟට ඒ කුසලය සම්පූර්ණ කර ගන්නවා, ඒ තමයි කර්මභවය. දැන් ඉතින් කරුණු හතරක් එකතු වුණා. ඒ තණ්හාවට මේ හතර සහයෝග වුණා අවිද්‍යාවයි, උපාදානයයි, සංස්කාරයි, කර්මභවයයි. එතකොට අපි පෙර භවයෙන් චුත වෙන කොට මරණාසන්න මොහොතේ දී ඒ කරගත්ත කුසලය සිහි වුණා. කුසලය හෝ ඒ කුසලය කරන්න උපකාර වූ දෙයක් හෝ උපදින්න නියමිත තැන නිමිත්තක් (මනුලොව නිමිත්තක්) හෝ කර්ම, කර්ම නිමිති, ගති නිමිති වශයෙන් ඒ තුනෙන් එකක් අපට වැටහුණා. ඒවා වැටහෙන කොට තමයි චුති චිත්තයට අනතුරුව මේ භවයේ මව් කුසක ප්‍රතිසන්ධි ගත්තෙ. ඒ ප්‍රතිසන්ධි ගත්ත විපාක චිත්ත-චෛතසික ධර්මයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍ය වුණේ කුමක්ද? ප්‍රධාන වශයෙන්ම පූර්වභව තෘෂ්ණාව.

ඒ ප්‍රතිසන්ධි සිත තමයි ඊළඟට භවාංග වශයෙන් පේළියට පේළියට අවුරුදු ගණනක් වැඩ කරන්නෙ චුතිය දක්වාම. එක ජීවිතයක චුතිය දක්වාම වැඩ කරන්නෙ විපාක සිත් වශයෙන් මේ ප්‍රතිසන්ධි ගත්ත සිත හා සමාන එම කුසලයේම විපාක සිත් පේළියයි. ඒකට කියනවා භවාංග කියලා. එතකොට ඒ භවාංග සිතක් තියෙන නිසයි වීථි සිත් පහළ වෙන්නෙ. ඒ භවාංගයට තමයි 'මනෝද්වාර' කියලා කියන්නේ. "සාවජ්ජනං භවංගන්තු මනෝද්වාරන්ති වුච්චති." ඒ කියන්නේ ඇසට යම් රූපයක් ලක් වුණහම ඒ චිත්ත වීථියේ මුළින්ම ඇති වෙනවා වීථි සිතක් 'පඤ්චද්වාරාවජ්ජන' කියලා. ඊට පෙර පහළ වෙනවා භවාංග සිත් තුනක් (භවාංග, භවාංග චලන, භවාංග උපච්ඡේදක). ඒවාට කියනවා 'මනෝද්වාර' කියලා. එතකොට මේ භවාංග තිබුණ නිසානෙ වීථි සිත් පහළ වෙන්නෙ. එතකොට සය දොරෙන්ම චිත්තවීථි පහළ වෙන්නෙ මේ භවාංගයෙන් නැගිටලා. එතකොට භවාංගයට හේතු වුණේ අර පූර්වභව තෘෂ්ණාව. අන්න ඒක නිසා මේ දුක උපදවනවා.

දැන් අපි සිල් ගත්තත්, භාවනා කළත් කුසල් සිත් පහළ වෙන කොට ඒ කුසල් සිත් වීථි පහළ වුණේ භවාංගයෙන් නැගිටලා. ඒ භවාංගය නොතිබුණා නම් මේ කුසල චිත්තවීථි එකක්වත් පහළ වෙන්නෙ නෑ. ඒ නිසා මේකට පූර්වභව තෘෂ්ණාව තමයි හේතුව. අන්න ඒක නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කළා ස්කන්ධ පඤ්චකයටම ප්‍රධාන හේතුව තණ්හාව බව. එතකොට මේ තණ්හාව 'සමුදය සත්‍යය' කියලා කිව්ව නේ.

සමුදය සත්‍යයේ තියෙනවා වැදගත් බෙදීමක්. නමුත් ඒක සූත්‍ර පිටකයෙහි දකින්න නෑ. අභිධර්ම පිටකයෙහි

තියෙනවා ලස්සනට තෝරලා. මම ඒක කෙටියෙන් කියලා දෙන්නම්. ඒක තියෙන්නෙ අභිධර්ම පිටකයේ සච්චවිභංගයේ, චතුරාර්ය සත්‍යය විස්තර කරන තැන. සමුදය සත්‍යය පස් වැදෑරුම් වෙනවා. එනම්,

1. "තණ්හා" ප්‍රධානම සමුදය සත්‍යය තණ්හාව.

2. "තණ්හා ච; අවසේසා ච කිලේසා." අවසේසා ච කිලේසා කියන්නෙ, අකුසල මූල කෙලෙස් වස්තු තියෙනවා දහයක්, එයින් එකක් තමයි ලෝභය. ඒ කෙලෙස් වස්තු දහයෙන් ලෝභය හැර ඉතිරි අකුසල මූල කෙලෙස් වස්තු නමය. ඒකත් සමුදය සත්‍යය වෙනවා.
   - එතකොට තණ්හාවත්, ඉතිරි අකුසල මූල කෙලෙස් වස්තු නමයත් දෙවන සමුදය සත්‍යයට අයත් වෙනවා.

3. "තණ්හා ච; අවසේසා ච කිලේසා; අවසේසා ච අකුසලා ධම්මා." අවසේසා ච අකුසලා ධම්මා කියන්නෙ, ඉතිරි අකුසල චිත්ත-චෛතසික ධර්ම සියල්ලම. ඒකත් සමුදය සත්‍යය වෙනවා.
   - එතකොට තණ්හාවත්, ඉතිරි අකුසල මූල කෙලෙස් වස්තු නමයත්, ඉතිරි අකුසල චිත්ත-චෛතසික ධර්ම සියල්ලත් තුන්වන සමුදය සත්‍යයට අයත් වෙනවා.

4. "තණ්හා ච; අවසේසා ච කිලේසා; අවසේසා ච අකුසලා ධම්මා; තීනි ච කුසල මූලානි සාසවානි." තීනි ච කුසල මූලානි සාසවානි කියන්නෙ, අපේ ලෞකික කුසල් සිත් තියෙනවනෙ දාහතක් (17). ඒ කුසල් සිත් දාහතෙහි තියෙනවා අලෝභ, අදෝස, අමෝහ කියන ලෞකික කුසල මූල තුන. ඒකත් සමුදය සත්‍යය වෙනවා.
   - එතකොට තණ්හාවත්, ඉතිරි අකුසල මූල කෙලෙස් වස්තු නමයත්, ඉතිරි අකුසල චිත්ත-චෛතසික ධර්ම

සියල්ලත්, ලෞකික කුසල මූල තුනත් හතරවන සමුදය සත්‍යයට අයත් වෙනවා.

5. "තණ්හා ච; අවසේසා ච කිලේසා; අවසේසා ච අකුසලා ධම්මා; තීනි ච කුසල මූලානි සාසවානි; අවසේසා ච සාසවා කුසලා ධම්මා." අවසේසා ච සාසවා කුසලා ධම්මා කියන්නෙ, ඉතිරි ලෞකික කුසල චිත්ත-චෛතසික ධර්ම සියල්ලම. ඒකත් සමුදය සත්‍යය වෙනවා.

- එතකොට තණ්හාවත්, ඉතිරි අකුසල මූල කෙලෙස් වස්තු නමයත්, ඉතිරි අකුසල චිත්ත-චෛතසික ධර්ම සියල්ලත්, ලෞකික කුසල මූල තුනත්, ඉතිරි ලෞකික කුසල චිත්ත-චෛතසික ධර්ම සියල්ලත් පස්වන සමුදය සත්‍යයට අයත් වෙනවා.

බුදුරජාණන් වහන්සේ තරම් මේවා බෙදලා පෙන්වපු කෙනෙක් ලෝකයේ තව නෑ. එතකොට මේ සමුදය සත්‍යය පස්වැදෑරුම් වෙනවා. ඒ සියල්ලෙන්ම ප්‍රධාන වෙන්නෙ තණ්හාව. අන්න ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළා,

"සබ්බදානං ධම්මදානං ජිනාති - සබ්බරසං ධම්මරසෝ ජිනාති
සබ්බරතිං ධම්මරති ජිනාති - තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති"

ධර්ම දානය සියලු දානයන් අතුරින් ශ්‍රේෂ්ඨයි. ධම්ම රසය සියලු රසයන් අතුරින් ශ්‍රේෂ්ඨයි. ධම්ම රතිය සියලු රතීන් අතුරින් ශ්‍රේෂ්ඨයි. තණ්හා ක්ෂය සංඛ්‍යාත නිර්වාණය සියලු දුක් ක්ෂය කරන බැවින් සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨයි.

ඒ නිසා අපි මේ කරන දාන-සීල-භාවනා ආදී සෑම කුසලයක දී ම අපේ ප්‍රාර්ථනාව විය යුත්තෙ එකසියඅට වැදෑරුම් තණ්හාව ක්ෂය කිරීමෙන් ලැබෙන තණ්හා ක්ෂය සංඛ්‍යාත ශාන්ත නිර්වාණ ධාතුව සාක්ෂාත් කර ගැනීමයි.

මේ පින්වතුන් අහලා තියෙනවනෙ අපේ බෝසතාණන් වහන්සේ බුදු වූ දවසෙ උදේ පාන්දරම මනෝමය වශයෙන් කළ ප්‍රීති වාක්‍යය.

> "අනේක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
> ගහකාරකං ගවේසන්තෝ දුක්ඛාජාති පුනප්පුනං
> ගහකාරක දිට්ඨෝසි පුනගේහං නකාහසි
> සබ්බා තේ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං
> විසංඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා"

එහි ලස්සන තේරුමක් තියෙනවා. මේක සියලු බුදුරජාණන් වහන්සේලා විසින් බුදු වූ මොහොතෙ මනෝමය වශයෙන් සිතනු ලබන ප්‍රීති වාක්‍යයක්. මේක සද්දෙ ඇහෙන්න කියලා නෑ. ශබ්ද නගා කියලා තියෙන්නෙ, බුදු වීමෙන් හත්වන දවසෙ පටිච්ච සමුප්පාදය මෙනෙහි කරන අවස්ථාවේ දී යි. එතකොට මේ ගාථාවෙ සඳහන් වෙනවා "දුක්ඛාජාති පුනප්පුනං" නැවත නැවත ඉපදීම දුකක් බව දැන, "ගහකාරකං ගවේසන්තෝ" ඒ දුක උපදවන කර්තෘතුමා සොය සොයා, ඒ කියන්නෙ පඤ්චස්කන්ධය නැමැති ගෘහය කරන කර්තෘතුමා සොය සොයා, "අනිබ්බිසං" දකින්න නොමැතිව, අල්ල ගන්න නොමැතිව, සොයාගන්න නොමැතිව, "අනේක ජාති සංසාරං සන්ධාවිස්සං" ප්‍රමාණ කළ නොහැකි තරම් දීර්ඝ සංසාරයේ ජාති ජරා මරණාදීන්ට පත් වෙමින් ඇවිද්දෙමි. "ගහකාරක

දිට්ඨෝසි'' මේ පඤ්චස්ඛන්ධය නැමැති ගෘහය කරන කර්තෘතුමනි, ඔබ මට පෙනුණා, ''පුනගේහං නකාහසි'' මින් මත්තෙ නම් ඔබ මට ගෙවල් සාදන්නේ නැත. මක් නිසාද? ''සබ්බා තේ ඵාසුකා භග්ගා'' ඔබගේ සියලු පරාල බින්දා. ''ගහකූටං විසංඛිතං'' ඔබගේ ගෘහයේ කැණිමඬල මම සුණුවිසුණු කළා. ''විසංඛාරගතං චිත්තං'' මගේ සිත අසංඛතයට ගියා. ''තණ්හානං ඛයමජ්ඣගා'' මේ භවයෙන් භවයට ගෙන යන තණ්හාව නැමති වඩුවාගේ අවසානය මම දැක්කා. එනම් තණ්හා ක්ෂය සංඛ්‍යාත අමාමහ නිවනට පත්
වුණා. නිවන සාක්ෂාත් කළා.

මේක තමයි පළමුවෙනි ප්‍රීති වාක්‍යය, උදාන වාක්‍යය. දැන් මේකෙන් අපිට පැහැදිළි වෙනවා අපිත් මේ වගේ තමයි. අපිත් නැවත නැවත ඉපදීම දුකක් බව දැන, ඉපදීම සිදු කරන කර්තෘ සොය සොයා මේ දන් දෙනවා, සිල් රකිනවා, භාවනා කරනවා. ඒ වගේම අපට තවම දැක ගන්න නොහැකි වෙලා අපි තවම සසර සැරිසරනවා. කවදා හරි දවසක රහත් බෝධියෙන්, පසේ බෝධියෙන්, අභිසම්බෝධියෙන් මේ කියන තණ්හාව අල්ලගෙන ඔහුගේ පරාල ටික කඩා දමලා, ඔහුගේ කැණිමඬල සුණුවිසුණු කරලා අසංඛත ධාතු සංඛාත තණ්හා ක්ෂය නම් වූ අමාමහ නිවනට පත් වෙනවා.

ඒ නිසා අපි මේ කරන සෑම කුසලයක්ම පාරමී බවට පත් වෙලා, බෝධිපාක්ෂික ධර්ම බවට පත් වෙලා, භවයෙන් භවයට ගෙනියන මේ එකසියඅට වැදෑරුම් තණ්හාව ගෙව ගෙවා දමමින්, භවයෙන් භවයට අපේ පාරමී ශක්තිය වැඩි දියුණු කර ගනිමින් ගමන් කොට තම තමන් බලාපොරොත්තු වන බෝධියානයකින් තණ්හා ක්ෂය

සංඛ්‍යාත ශාන්ත නිර්වාණ ධාතුව සාක්ෂාත් කරගන්න අපි සැමදෙනාටම හේතු වාසනා ලැබේවා කියලා අධිෂ්ඨාන කරගනිමු.

ශ්‍රද්ධාවෙන් නුවණින් යුතුව මේ ස්ථානයට ගෞරව සම්ප්‍රයුක්තව පූජා භාණ්ඩ රැගෙන පැමිණියා. ඒ වගේම සීලයක පිහිටා බුද්ධ පූජා බෝධි පූජා පැවැත්වුවා. ස්වල්ප වේලාවක් දහම් පදයකට සවන් දුන්නා. මෙතෙක් වේලා සිතින් කයින් වචනයෙන් අප රැස් කරගත්ත කුසලයත්, අද දවස පුරා සිල් පිරිස සීල භාවනාවෙහි යෙදීමෙන් අත්පත් කරගත්ත ප්‍රතිපත්ති කුසලයත්, තුන් ලෝකයටම පිහිට වෙන්න ලොව පහළ වූ ශාන්ති නායකයාණන්ගේ දෙසිය සොළසක් (216) මගුල් ලක්ෂණයෙන් බබළන ශ්‍රී පාදපද්ම මූලයෙහි බුද්ධ පූජාවක් වේවා! නවලෝකෝත්තර ධර්ම ධාතුව උදෙසා ධර්ම පූජාවක් බවට පත් වේවා! ආර්ය මහා සංඝ රත්නය උදෙසා සංඝ පූජාවක් බවට පත් වේවා! කල්‍යාණ මිත්‍ර ගුරු උතුමන්ගේ දෙපා මුල, දෙමව්පියන්ගේ දෙපා මුල ගුරු-දෙගුරු පූජාවක් බවට පත් වේවා!

නමින් අභාවප්‍රාප්ත මව්-පිය, ගුරුවරු, බන්ධු-මිත්‍ර ආදී සියලුම ඥාතීන්ට මේ කුසලානිසංසයෙන් සුගති සම්පත් සිද්ධ වී, බෝධිසම්භාර මුදුන්පත් වී පැතූ බෝධියකින් අමාමහ නිවන් සුව අත් වේවා කියා කරුණාවෙන් පින් දෙමු.

එසේම ශාසනාරක්ෂක, ලෝකපාලක, ආත්මාරක්ෂක සියලු දේවතා මණ්ඩලය ද සාදරයෙන්, සමාදරයෙන්, කරුණා මෛත්‍රියෙන් පින් අනුමෝදන්ව දිව්‍යමය ඓශ්වර්යයෙන් වැඩෙත්වා! ධ්‍යාන, අභිඥා, විපස්සනා ඥාණ වැඩෙත්වා! සම්බුද්ධ

ශාසනයට, බෞද්ධ ජනතාවට, සඟරුවනට, අප ජීවත්වන ශ්‍රී ලංකාද්වීපයට ද දේවාරක්ෂාව සළසා දෙත්වා! පැතූ බෝධියකින් නිවන් සුව ලබත්වා කියා මෛත්‍රියෙන් පින් දෙමු.

සාධු! සාධු! සාධු!

(මෙම ධර්ම පුස්තකය කිහිප වරක් කියවා තව කෙනෙකුට පරිත්‍යාග කිරීම උතුම් ධර්ම දානයකි.)